# කොළඹ විශ්වවිද්‍යාලය
# ශ්‍රී ලංකාව
## පුරප්පාඩු (කොන්ත්‍රාත් පදනම මත)

කොළඹ විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලයෙහි පහත සඳහන් තනතුර සඳහා යෝග්‍ය සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

❖ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු (පුරප්පාඩු 01)

රැකියාවේ වගකීම්

- පොත් බැඳීම් , ක්‍රීස් කිරීම් සහ කැපුම් යන්ත්‍ර ද ඇතුළුව ඩිජිටල් හා ඕෆ්සෙට් යන්ත්‍ර ක්‍රියා කරවීම පිළිබඳ සමස්ත දැනුම ලබා තිබිය යුතුය.
- අවශ්‍ය පරිදි නඩත්තු කිරීම, පවිත්‍රතාවය හා සුළු අලුත්වැඩියා කිරීම් සිදුකිරීම පිළිබඳ වගකිව යුතුය.
- සේවාලාභියාගේ අවශ්‍යතා පිළිබඳව කියවා දැනුවත් විය යුතුය.
- ගුණාත්මකභාවය, තොග සහ පිරිවිතර ආදිය පරීක්ෂා කළ යුතුය.
- කලට වේලාවට වැඩ අවසන් කර භාරදිය යුතු අතර සේවාලාභියා තෘප්තියට පැමිණවිය යුතුය.

අවම සුදුසුකම් : <u>අධ්‍යාපන සුදුසුකම්</u>

- ගණිතය සහ ඉංග්‍රීසි ඇතුලු විෂයයන් තුනකට සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී විෂයයන් හයකින් සමත් වී තිබිය යුතුය.
- නව නිර්දේශයේ විෂයයන් තුනක් හෝ පැරණි නිර්දේශයේ විෂයයන් හතරක් සහිතව අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත් වී තිබිය යුතුය.
- ඉංග්‍රීසි භාෂාව කියවීමට හා ඉංග්‍රීසියෙන් සන්නිවේදනය කිරීමට හැකියාව තිබිය යුතුය.

<u>වෘත්තීය සුදුසුකම්</u>

- ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයෙන් හෝ රජයේ පිළිගැනීම ලත් වෙනත් ඕනෑම ආයතනයකින් ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සාර්ථකව හදාරා තිබීම

<u>සේවා පළපුරුද්ද</u>

- ඩිජිටල් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවකු ලෙස පිළිගැනීම ලත් ආයතනයක හෝ මුද්‍රණාලයක වසර තුනක සේවා පළපුරුද්ද

වයස : අවු. 21- 45 අතර
මාසික වැටුප :රු. 60,000/= ජීවන වියදම් සමග (සාකච්ඡා කළ හැකිය)
කොන්ත්‍රාත් කාලය : වසර 1 කි.

පොදු කොන්දේසි

මෙම පත්වීම කොන්ත්‍රාත් පදනම මත ආරම්භයේදී වසරක කාලයක් සඳහා ලබා දෙන්නකි. කෙසේ වෙතත් කොන්ත්‍රාත් කාලසීමාව තුළ ඉටුකරන කාර්යසාධනය පිළිබඳ සෑහීමට පත්විය හැකි නම් තෝරා ගනු ලබන අයදුම්කරුගේ කාලසීමාව දීර්ඝ කිරීම පිළිබඳ සලකා බැලීමට විශ්වවිද්‍යාලයට හැකියාව තිබේ.

අදාළ අයදුම්පත් www.cmb.ac.lk යන විශ්වවිද්‍යාල වෙබ් අඩවිය තුළින් බාගත කරගත හැකිය.

නිසි පරිදි පුරවන ලද අයදුම්පත් 2022.04.04 වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ අනධ්‍යයන ආයතන, කොළඹ විශ්ව විද්‍යාලය, අංක **94**, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ **03** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුරෙහි නම සඳහන් කළ යුතුය. අයදුම්පත සමග අයදුම්කරුගේ යෝග්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය සහතිකවල ඡායා පිටපත් එවිය යුතු අතර සහතිකපත්වල ඡායා පිටපත් රහිතව ඉදිරිපත් කෙරෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේඛකාධිකාරී,
කොළඹ විශ්වවිද්‍යාලය,
කොළඹ 03.
2022.03.15